THE WORLD BANK
IBRD · IDA | WORLD BANK GROUP

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය

## සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය

## ප්‍රාථමික සෞඛ්‍ය සේවා පද්ධති ශක්තිමත් කිරීමේ ව්‍යාපෘතිය (PHSEP)

# ව්‍යාපෘති කාර්ය මණ්ඩලය බඳවා ගැනීම

## ව්‍යාපෘති ගණකාධිකාරී - තනතුරු 01

## මූල්‍ය නිලධාරී - තනතුරු 01

ප්‍රාථමික සෞඛ්‍ය සේවා පද්ධතිය ශක්තිමත් කිරීමේ ව්‍යාපෘතිය (PHSEP) යනු ලෝක බැංකු (WB) මූල්‍යාධාර යටතේ සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය මගින් ක්‍රියාත්මක කරනු ලබන ව්‍යාපෘතියකි. මෙහි මුළු ව්‍යාපෘති පිරිවැය ඇමරිකානු ඩොලර් මිලියන 150ක් වන අතර, එය 2024-2028 කාලසීමාව තුළ ශ්‍රී ලංකාවේ සියලුම දිස්ත්‍රික්කවල ප්‍රාථමික සෞඛ්‍ය සේවාවල ප්‍රවේශය සහ ගුණාත්මකභාවය ඉහළ නැංවීම සඳහා සැලසුම් කර ඇත.

ව්‍යාපෘති කළමනාකරණ ඒකකයේ (PMU) ව්‍යාපෘති ගණකාධිකාරී සහ මූල්‍ය නිලධාරී තනතුරු පිරවීම සඳහා ශ්‍රී ලංකා පුරවැසියන් වෙතින් අයදුම්පත් කැඳවනු ලැබේ. පළපුරුද්ද සහ සුදුසුකම් (ඇමුණුම 01), තනතුර සඳහා වන වේතන (ඇමුණුම 02) සහ වැඩිදුර තොරතුරු කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද 2026 මාර්තු 28 දිනැති අංක 02/2026 දරන චක්‍රලේඛය මත පදනම් වේ.

| තනතුරු | තනතුරු සංඛ්‍යාව | කාණ්ඩය (අංක 02/2026) චක්‍රලේඛයට අනුව | සුදුසුකම් |
|---|---|---|---|
| ව්‍යාපෘති ගණකාධිකාරී | 01 | DI කාණ්ඩය | 01. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් අදාළ විෂය ක්ෂේත්‍රයකින් ප්‍රථම උපාධියක් ලබා තිබීම සහ ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ (CA Sri Lanka) පදනම් විභාගය ii අන්තර් මාධ්‍ය විභාගයෙන් සමත්ව තිබීම/ ගිණුම්කරණය හා ව්‍යාපාර අදියර ii සහතිකය ලබා තිබීම/ ආයතනික මට්ටමේ විභාගය සමත්ව තිබීම හෝ අදාළ ක්ෂේත්‍රයේ පිළිගත් වෘත්තීය ආයතනයකින් ලබාගත් සමාන වෘත්තීය සුදුසුකමක් තිබීම<br>සමග<br>අදාළ ක්ෂේත්‍රයේ වසර 06 ක පශ්චාත් සුදුසුකම් පළපුරුද්ද තිබීම.<br>හෝ<br>02. අදාළ ක්ෂේත්‍රයේ පිළිගත් වෘත්තීය ආයතනයක ආශ්‍රිත සාමාජිකත්වය (Associate membership) හෝ සමාන වෘත්තීය සුදුසුකමක් ලබා තිබීම<br>සමග<br>අදාළ ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර 03 ක පශ්චාත් සුදුසුකම් පළපුරුද්ද තිබීම.<br>හෝ<br>03. අදාළ ක්ෂේත්‍රයේ සමාන තත්ත්වයක සිටින සමස්ත ලංකා සේවා III/II පන්තියේ හෝ ඊට ඉහළ රජයේ නිලධාරියෙකු වීම<br>සමග<br>අදාළ ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර 06 ක පශ්චාත් සුදුසුකම් පළපුරුද්ද තිබීම.<br>කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද චක්‍රලේඛ 02/2026 ඇමුණුම 1, පිටුව vii, Di හි (uss 25ට වැඩි හා US$ 200 අඩු හෝ ඊට සමාන තීරුව බලන්න |
| | | | වේතනය |
| | | | රු. 250,000.00 - 270,000.00 + ජීවන වියදම් දීමනාව<br>කළමනාකාර සේවා චක්‍රලේඛ 02/2026 ඇමුණුම 2, පිටුව xiii කාණ්ඩය DI (ඇමරිකානු ඩොලර් (US$) මිලියන 25 ට වැඩි සහ US$ මිලියන 200 අඩු හෝ ඊට සමාන තීරුව බලන්න. |
| මූල්‍ය නිලධාරී | 01 | F කාණ්ඩය | 01. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් අදාළ ක්ෂේත්‍රයේ උපාධියක් හෝ TVEC විසින් පිළිගත් තාක්ෂණික / වෘත්තීය පුහුණු ආයතනයක් මගින් නිකුත් කරන ලද NVQ7 මට්ටමට නොඅඩු නිපුණතා සහතිකයක් තිබීම.<br>සමග<br>අදාළ ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර 02 ක පශ්චාත් සුදුසුකම් පළපුරුද්ද තිබීම.<br>හෝ<br>02. TVEC විසින් පිළිගත් තාක්ෂණික/ වෘත්තීය පුහුණු ආයතනයක් මගින් නිකුත් කරන ලද NVQ6 මට්ටමට නොඅඩු නිපුණතා සහතිකයක් තිබීම<br>සමග<br>අදාළ ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර 05 ක පශ්චාත් සුදුසුකම් පළපුරුද්ද තිබීම.<br>හෝ<br>03. TVEC විසින් පිළිගත් තාක්ෂණික / වෘත්තීය පුහුණු ආයතනයක් මගින් නිකුත් කරන ලදස NVQ5 මට්ටමට නොඅඩු නිපුණතා සහතිකයක් තිබීම.<br>සමග<br>අදාළ ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර 08 ක පශ්චාත් සුදුසුකම් පළපුරුද්ද තිබීම.<br>කළමනාකරණ සේවා චක්‍රලේඛ 02/2026 ඇමුණුම 01 පිටුව vii කාණ්ඩය FC US$ මිලියන 25 ට වැඩි සහ US$ මිලියන 200 ට අඩු හෝ ඊට සමාන තීරුව බලන්න. |
| | | | වැටුප |
| | | | රු. 150,000.00 - 165,000.00 ජීවන වියදම් දීමනාව (COL)<br>කළමනාකාර සේවා චක්‍රලේඛ 02/2026 ඇමුණුම 2, පිටුව xiii කාණ්ඩය F US$ මිලියන 25 ට වැඩි සහ US$ මිලියන 200 අඩු හෝ ඊට සමාන තීරුව බලන්න. |

ව්‍යාපෘති විස්තර සඳහා කරුණාකර https://phsep.lk වෙත පිවිසෙන්න.

අධ්‍යාපන, පළපුරුද්ද සහ අනෙකුත් සුදුසුකම්වල සහතික පිටපත් සමග සවිස්තරාත්මක ජීව දත්ත පත්‍රිකාවක් (නිශ්චිත ආකෘතියක් නොමැත), සම්බන්ධ කර ගත හැකි දුරකථන/ෆැක්ස්/විද්‍යුත් තැපැල් ලිපිනයන් ද ඇතුළත් කර **2026 මැයි 29** වන දින හෝ ඊට පෙර ලියාපදිංචි තැපෑලෙන් පමණක් කවරයේ වම් පස ඉහළ කෙළවරේ (අයදුම්කරණ තනතුර) සඳහා අයදුම්පත" යන්න සඳහන් කොට පහත ලිපිනයට එවිය යුතුය.

**ලිපිනය :**

**ව්‍යාපෘති අධ්‍යක්ෂ,**
**ප්‍රාථමික සෞඛ්‍ය සේවා පද්ධතිය ශක්තිමත් කිරීමේ ව්‍යාපෘතිය (PHSEP),**
**191 A, ජේ. ආර්. ජයවර්ධන මධ්‍යස්ථානය, "The Bungalow",**
**ධර්මපාල මාවත, කොළඹ 07.**
**විද්‍යුත් තැපෑල: info@phsep.lk**
**දුරකථන : 0112 271150**

අවශ්‍ය සුදුසුකම්, පළපුරුද්ද, කුසලතා සහ නිපුණතා සපුරා නොමැති, ප්‍රමාද වී ලැබෙන, අසම්පූර්ණ, උපකාරක ලේඛන ඇතුළත් නොකළ, සහ ලියාපදිංචි තැපෑලෙන් හැර වෙනත් ක්‍රම මගින් (විද්‍යුත් තැපෑල, අතින් ගෙනවිත් භාරදීම හෝ වෙනත් ඕනෑම ලිපිනයකට) එවනු ලබන අයදුම්පත් සලකා බලනු නොලබන අතර ඒවා ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**ව්‍යාපෘති අධ්‍යක්ෂ,**
**ප්‍රාථමික සෞඛ්‍ය සේවා පද්ධති වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිය, (PHSEP)**
**2026 මැයි 15 වන දින**